රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:38/89(1)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1990 මාර්තු මස 22 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>එක් භාෂාවකට වඩා භාෂා ගණනක ප්‍රවීණතාව ඇති රාජ්‍ය නිලධාරීන්ට දිරිගැන්වීමේ දීමනා, වැටුප් වර්ධක සහ උසස්වීම්.</u>**

1989.07.31 දිනැති අංක:38/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවයි.

02. උක්ත චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ඇතැම් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ගෙවීම් කර ඇති බව මගේ අවධානයට ලක් කර තිබේ. චක්‍රලේඛයේ විධිවිධාන අනුව එවැනි අවස්ථා නිවැරදි කිරීමට බලධාරීන් වහා පියවර ගත යුතුය. දිරිගැන්වීම් දීමනා සඳහා හිමිකම තීරණය කිරීමේදී බලධාරීන්ට පහසු කරවනු පිණිස පහත දැක්වෙන පැහැදිලි කිරීම් ද කරනු ලැබේ.

1. ඉහත සඳහන් චක්‍රලේඛයේ 3:1 (අ), (ආ ) සහ 03:ii (අ) වගන්ති යටතේ ගෙවීමක් කළ හැක්කේ උක්ත චක්‍රලේඛයේ 02 (අ) හි නියමිත ලිඛිත හා වාචික පරීක්ෂණ දෙකම සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. මෙම විභාග සෑම වසරකම දෙසැම්බර් මාසයේදී විභාග කොමසාරිස්වරයා විසින් පවත්වනු ඇත. භාෂාවක් විෂයයක් ලෙස අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී සමත්ව සිටීම උක්ත චක්‍රලේඛයේ 02 (අ) වගන්තියේ සඳහන් දහවැනි ශ්‍රේණිය ලිඛිත කොටස පමණක් සමත්වීම සේ සැලකේ.
   එබැවින් නිලධාරියා ලිඛිත විභාගය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ විශිෂ්ඨ සාමාර්ථයක් හෝ ලබාගෙන තිබුනේ වී නමුදු දිරිගැන්වීම් දීමනා ගෙවීමක් කළ හැකි වන්නේ ලිඛිත හා වාචික පරීක්ෂණ දෙකම සම්පූර්ණ කිරීමෙන් පසුවය. එවැනි ගෙවීම් එසේ පරීක්ෂණ දෙකම සම්පූර්ණ කරන දින සිට බලපවත්වන සේ කෙරෙනු ඇත. මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා අ.පො.ස.(සා.පෙ.) විභාගයේ ඉංග්‍රීසි භාෂාව "අ" සහ "ආ" නිර්දේශ දෙකම සමාන සේ සැලකේ.

ii උක්ත චක්‍රලේඛයේ 03 : ii ( ආ) සහ ( අං ) වගන්තිවල සඳහන් කර ඇති පරිදි අ.පො.ස.(සා.පෙ.) විභාගයට වඩා ඉහළ සහතික සඳහා දිරිගැන්වීමේ දීමනා ගෙවීම චක්‍රලේඛයේ දින සිට හෝ විභාගය සමත් වූ දින හෝ යන දෙකෙන් පසුව එළඹෙන දින සිට කළ හැකිය. කෙසේ වෙතත් දිරිගැන්වීම් දීමනා ගෙවිය යුත්තේ දිරිගැන්වීමේ දීමනා ගෙවීම සඳහා නියමිත භාෂාවක් විෂයයක් ලෙස සමත් නිලධාරීන්ට පමණි. නමුත් රාජ්‍ය

සේවයට ඇතුළත් වූ භාෂා මාධ්‍යයට වෙනස් මාධ්‍යයකින් එවැනි විභාගයකදී පිළිතුරු සපයා ඇතත් නියමිත භාෂාවක් නොවන වෙනස් විෂයයක් විභාගයකදී සමත් නිලධාරියකුට දිරිගැන්වීමේ දීමනා නොගෙවිය යුතුය.

iii උක්ත චක්‍රලේඛයේ නිශ්චිතව සඳහන් කර නොමැති සහතික සඳහා ගෙවීම් නොකළ යුතුය.

iv රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් හෝ දෙවැනි භාෂා අවශ්‍යතාවයෙන් හෝ නිදහස් වීම සඳහා භාවිතා කර ඇති සහතිකයේ මට්ටම දක්වා එම භාෂාව වෙනුවෙන් දිරිගැන්වීම් දීමනා නොගෙවිය යුතුය. උදාහරණයක් වශයෙන් නිලධාරී එසේ භාවිතා කර අංත්තේ අ.පො.ස.(සා.පෙ.) ඉංග්‍රීසි භාෂාව සහතිකය නම් සම්මාන සාමාර්ථයක් හෝ විශිෂ්ඨ සාමාර්ථයක් හෝ තිබුනේ වී නමුදු ඔහු දිරිගැන්වීමේ දීමනා සඳහා සුදුසුකම නොලබයි.

v භාණ්ඩාගාර චක්‍රලේඛ 379 යටතේ රු:500/= ක මුදලක් ගෙවා ඇති නිලධාරයකු සිංහල භාෂාවෙන් අ.පො.ස. (සා.පෙ.) මට්ටම දක්වා සේවය කිරීමට බැඳී සිටින හෙයින් ඒ මට්ටම දක්වා සිංහල භාෂාවට දිරිගැන්වීම් දීමනා ලැබීමට සුදුසුකම් නොලබයි.

vi සියළුම ගෙවීම් කළයුත්තේ උක්ත චක්‍රලේඛයේ 06 වැනි වගන්තියට යටත්වය.

vii සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවෙන් හැර වෙනත් කිසිදු භාෂාවක් සඳහා දිරිගැන්වීම් දීමනා නොගෙවිය යුතුය.

viii සේවයට බඳවා ගන්නා ලද්දේ විභාගයක් පැවැත්වීමෙන් නම් නිලධාරියා එම විභාගයට පිළිතුරු සැපයූ මාධ්‍යයද, විභාගයක් නොපවත්වන ලද නම් ඔහු/ ඇය මූලික අධ්‍යාපනය ලද මාධ්‍යයද, වෙනත් සෑම අවස්ථාවකම ඔහු සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ මාධ්‍යයද වර්තමාන සේවයට බඳවාගත් මාධ්‍ය තීරණය කිරීමේදී බලධාරීන් සැලකිල්ලට ගත යුතුය.

ix උක්ත චක්‍රලේඛයේ 06 වැනි වගන්තියට යටත්ව උපරිම වශයෙන් නියමිත භාෂා දෙකකට වෙන වෙනම දිරිගැන්වීම් දීමනා ගෙවිය හැකිය.

මෙම ක්‍රමය යටතේ වැටුප් වර්ධක ගෙවීමේදී නිලධාරියා ඊළඟ ඉහළ වැටුප් පියවරේ නොතැබිය යුතුය. එහෙත් ඊළඟ ඉහළ වැටුප් වර්ධකයට සමාන දීමනාවක් ගෙවිය යුතුය. නිලධාරියා වැටුප් තලයේ උපරිමයට පැමිණ ඇති අවස්ථාවක දී ඔහු අවසානවරට ලැබූ වැටුප් වර්ධකයට සමාන දීමනාවක් ගෙවිය යුතුය.

අ.කලේ/(පී.එන්.එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන. පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.